# කැලණිය විශ්වවිද්‍යාලය
## களனிப் பல்கலைக்கழகம்
## UNIVERSITY OF KELANIYA


මගේ අංකය
எனது இல
My No.

ඔබේ අංකය
உமது இல
Your No.

2025.07.17

මහත්මයාණෙනි/මහත්මියනි/මෙනෙවියනි,

<u>උපාධි ප්‍රදානෝත්සවය -2025 අගෝස්තු මස 25 - තෙවන සැසිය.</u>

කැලණිය විශ්වවිද්‍යාලයේ **වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨයේ උපාධි පරීක්ෂණ සම්පූර්ණ කිරීමෙන් උපාධිලාභී වූවන්ට** උපාධි ප්‍රදානය කිරීම සඳහා වන උපාධි ප්‍රදානෝත්සවය <u>2025 අගෝස්තු මස 25 වැනි සඳුදා</u> සවස 3.30 සිට සවස 6.00 දක්වා (තෙවන සැසිය) බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වේ. මෙම උපාධි ප්‍රදානෝත්සවයට සහභාගි වන ලෙස ඔබට මෙයින් සතුටින් ආරාධනය කරමි.

1. **2025.08.17 ඉරිදා දින පෙරවරු 9.30 සිට පස්වරු 12.00 දක්වා කැලණිය විශ්වවිද්‍යාලයේ පරිපාලන ගොඩනැගිල්ලේ පිහිටි විභාග අංශයෙන් උපාධි ලෝගු සහ කරමාල නිකුත් කරනු ලැබේ.** උපාධි ලෝගු සහ කරමාල භාරගැනීම සඳහා තම ශිෂ්‍ය හැඳුනුම්පත, ජාතික හැඳුනුම්පත හෝ විදේශ ගමන් බලපත්‍රය රැගෙන පැමිණිය යුතුය. **<u>අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ඉහත දැක්වෙන හැඳුනුම්පතක් ඉදිරිපත් නොකරන කිසිවෙකුට උපාධි ලෝගු සහ කරමාල නිකුත් කරනු නොලැබේ.</u> උපාධි ලෝගු සහ කරමාල භාරගැනීම සඳහා උපාධිලාභියාම පැමිණිය යුතුය.**

2. උපාධිලාභි නාමලේඛනයේ ඔබගේ නමට හිමි අංකය අනුව උපාධිලාභීන් පිළිවෙළින් දෙදෙනා බැගින් උපාධිලාභීන්ගේ පෙරහැර සඳහා පෙළගැසී සිටිය යුතුය. උපාධිලාභීන්ගේ පෙරහැර ශාලාවට ඇතුළු වූ පසු පැමිණෙන උපාධිලාභීන් කිසිවෙකුටත් උපාධි ශාලාවට ඇතුළු වීමට අවසර දෙනු නොලැබේ.

3. ඔබ වෙනුවෙන් උපාධි ප්‍රදානෝත්සවය සඳහා ආරාධිතයන් දෙදෙනෙකු සහභාගි කරවා ගැනීමට අවස්ථාව සලසා ඇත. උපාධි ප්‍රදානෝත්සවයේ වැඩ සටහන් විස්තරය සහ ආරාධනා පත්‍ර උපාධි ලෝගු සහ කරමාල නිකුත් කරනු ලබන අවස්ථාවේදී ලබාදීමට කටයුතු යොදා ඇත.

4. **උපාධි ප්‍රදානෝත්සව ශාලාව ඇතුළත ඡායාරූප ගැනීම තහනම් වන අතර, කැමරා සහ ජංගම දුරකථන ශාලාව තුළට ගෙන ඒමටත්, වයස අවුරුදු 12 ට අඩු ළමුන් ශාලාවට ඇතුල් කිරීමටත් අවසර දෙනු නොලැබේ.**

5. උපාධි ප්‍රදානෝත්සවය අවසන් වී දින 07 ක් ඇතුළත (සෙනසුරාදා හා ඉරිදා දින හැර) උපාධි ලෝගු සහ කරමාල විශ්වවිද්‍යාලයට ආපසු භාරදිය යුතු ය. උපාධි ලෝගු සහ කරමාල භාරදීම ප්‍රමාද වන සෑම දිනයක් සඳහාම රුපියල් 50/- ක අතිරේක ගෙවීමක් කිරීමට සිදුවේ. තවද උපාධි ලෝගුවට සහ කරමාලයට කිසියම් හානියක් සිදුවුවහොත් එහි වටිනාකම සමග **<u>අතිරේක 25% ක ගාස්තුවක්</u>** ගෙවීමට සිදුවන බව ද මෙයින් දන්වමි.


University of Kelaniya, Kandy Road, Dalugama, Kelaniya 11600, Sri Lanka.
Web: www.kln.ac.lk | Email: info@kln.ac.lk
+94 11 2 911391, +94 11 2 911397, +94 11 2 910164, +94 11 2 911407, +94 11 2 913854-8

6. උපාධි ප්‍රදානෝත්සවයට සහභාගි වන පිරිමි උපාධිලාභීහු **ජාතික ඇඳුම හෝ යුරෝපීය ඇඳුම ඇඳිය යුත්තාහ. කාන්තා උපාධිලාභීන් පෙරදිග සිරිත අනුව විචිත්‍රවර්ණයෙන් හා උත්සව විලාසයෙන් පැමිණිය යුතුය.**

7. උපාධි ප්‍රදානෝත්සව අවස්ථාවේ ඡායාරූප ලබා ගැනීමට පහසුකම් විශ්වවිද්‍යාලය මගින් සලසා ඇත. ඡායාරූප ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා නියමිත මුදල **විශ්වවිද්‍යාලය විසින් අවසරය ලබා දී ඇති ඡායාරූප ශිල්පියා** වෙත උපාධි ලෝගු ලබාගන්නා අවස්ථාවේ දී ගෙවිය යුතු ය.

8. කැලණිය විශ්වවිද්‍යාලයේ **www.news.kln.ac.lk** වෙබ් අඩවියට පිවිසීමෙන් හෝ 011-2903112,114 **දුරකථන අංක ඇමතීමෙන්** වැඩි විස්තර ලබාගන්නා ලෙස කාරුණිකව දන්වමි.

මෙම ලිපිය උපාධි ප්‍රදානෝත්සවයට සහභාගි වීම සඳහා ඔබට/ඔබ වහන්සේට කෙරෙන ආරාධනයක් සේ සලකන්න.

මෙයට-විශ්වාසී,

ආර්.එම්.එම්.එල්.බී.වැවේගම
නියෝජ්‍ය ලේඛකාධිකාරී/විභාග
ලේඛකාධිකාරී වෙනුවට
011-2903112,114

මගේ අංකය
எனது இல
My No.

ඔබේ අංකය
உமது இல
Your No.

17.07.2025

Dear Sir/ Dear Madam,

**Convocation – 25th August 2025 – Third Session**

The Convocation for the conferment of degrees to the Graduands of the **Faculty of Commerce & Management Studies of the University of Kelaniya** will be held from 03.30 p.m to 06.00 p.m (Third Session) on **Monday**, **25th August 2025** at the **Bandaranaike Memorial International Conference Hall, (BMICH) Sri Lanka.**

You are kindly invited to be present at this Convocation.

1. The **Cloaks** and **Garlands** will be issued on **Sunday 17th August 2025** from **9.30 a.m.** to **12.00 p.m.** at the **Examinations Branch of the University of Kelaniya**. You are required to produce your **Student's Identity Card**, **National Identity** Card or **Passport** in order to obtain Cloaks and Garlands. **Cloaks and Garlands will not be issued to those who fail to produce any of those to prove their identity.**

2. The number assigned to you in the List of Graduands is indicated at the end of this letter and you must appear in the Procession of the Graduands according to the number given. No Graduands will be permitted to enter the Convocation Hall after the Graduands Procession enters into the Convocation Hall.

3. You will receive two invitations for your invitees and the programme of the Convocation when you obtain cloaks & garlands.

4. **Taking photographs inside the Convocation Hall is strictly prohibited. No one is permitted to take Cameras and Cellular Phones and bring Children into the hall.**

5. Cloaks and Garlands should be returned to the University **within 07 days(Except Saturdays & Sundays)** after the Convocation. Rs. 50/- will be charged for each day of delay from those who fail to return the Cloaks and Garlands. You are informed that if any damage caused to **the cloak and garland you are required to pay its value and additional amount of 25% of it.**

6. Arrangements have been made for you to obtain photographs at the Convocation. Details will be available to you, when you obtain Cloaks and Garlands.

7. You are kindly requested to visit the University of Kelaniya website www.news.kln.ac.lk to get further information.

8. Please consider this letter as an **invitation** for you to participate in the Convocation.

**Inquiries : 011-2903112/114**

**R.M.M.L.B.Wewegama**
**Deputy Registrar/Exam**
**for Registrar**